# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

## අධ්‍යක්ෂ - පාලන හා ආයතනික කටයුතු තනතුරට බඳවා ගැනීම (බාහිර)

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) ඉහත තනතුරේ පුරප්පාඩුව ස්ථිර පදනම මත පිරවීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**(1) රැකියා විස්තරය**

1. මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්ති සහ පටිපාටි සංවර්ධනය කිරීම.
2. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම.
3. නිසි පුහුණු සැලැස්ම ක්‍රියාත්මක කිරීම.
4. ප්‍රසම්පාදන කාර්යයන් සහතික කිරීම.
5. සැලසුම්/ප්‍රගති අධීක්ෂණය සහ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ සමස්ත අධීක්ෂණ කටයුතු සිදු කිරීම.
6. මාධ්‍ය, ප්‍රචාරණ සහ ප්‍රකාශන කටයුතු අධීක්ෂණය කිරීම සහ මෙහෙයවීම.

**(2) අවශ්‍ය අවම අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද:**

කළමනාකරණය හෝ රාජ්‍ය පරිපාලනය හෝ ව්‍යාපාර පරිපාලනය හෝ මානව සම්පත් කළමනාකරණය ක්ෂේත්‍රයේ 1 වන හෝ 2 වන පන්තියේ ගෞරව උපාධියක් සහ පශ්චාත් උපාධියක් සමඟ කළමනාකරණ මට්ටමේ වසර 20 ක සතුටුදායක සේවා පළපුරුද්දක් තිබිය යුතු අතර , ඉන් අවුරුදු 07 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ සතුටුදායක සේවා පළපුරුද්දක් සහිත විම .

හෝ

කළමනාකරණය හෝ රාජ්‍ය පරිපාලනය හෝ ව්‍යාපාර පරිපාලනය හෝ මානව සම්පත් කළමනාකරණය ක්ෂේත්‍රයේ පළමු හෝ දෙවන පන්තියේ ගෞරව උපාධියක් සහ එම ක්ෂේත්‍රයේ වෘත්තිය ආයතනයක ආයතනික සාමාජිකත්වයක් සමඟ කළමනාකරණ මට්ටමේ වසර 20 ක සතුටුදායක සේවා පළපුරුද්දක් තිබිය යුතු අතර , ඉන් අවුරුදු 07 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ සතුටුදායක සේවා පළපුරුද්දක් සහිත වීම .

හෝ

කළමනාකරණය හෝ රාජ්‍ය පරිපාලනය හෝ ව්‍යාපාර පරිපාලනය හෝ මානව සම්පත් කළමනාකරණය ක්ෂේත්‍රය පිළිබඳ උපාධියක් සහ පශ්චාත් උපාධියක් ලබා තිබීම සහ දිප ව්‍යාප්ත සේවයේ I පන්තියේ නිලධාරියෙකු විම.

හෝ

කළමනාකරණය හෝ රාජ්‍ය පරිපාලනය හෝ ව්‍යාපාර පරිපාලනය හෝ මානව සම්පත් කළමනාකරණය ක්ෂේත්‍රයේ මූලික උපාධියක් සහ එම ක්ෂේත්‍රයේ වෘත්තිය ආයතනයක ආයතනික සාමාජිකත්වය සහ දීප ව්‍යාප්ත සේවයේ I පන්තියේ නිලධාරියෙකු වීම.

**(3) බඳවා ගැනීමේ පටිපාටිය**

බඳවා ගැනීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සිදු කෙරේ.

**(4) වැටුප් පරිමාණය :-** TRC 1.3 -Rs. 262,752 (10x11,261) -(10x12,669) – 502,052

**(5) වයස :** අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 24-55 විය යුතුය.

**(6) අයදුම් කිරීමේ ක්‍රමය**

1. අයදුම්පත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.trc.gov.lk. වෙතින් බාගත කර ගත හැකිය.
2. නියමිත ආකෘතිය අනුව පිළියෙල නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
3. අයදුම්පත් පැහැදිලි සහ කියවිය හැකි විය යුතු අතර, අවශ්‍යතා නොසපුරන අයදුම්පත් සලකා බලනු නොලැබේ.
4. සම්පූර්ණ කරන ලද අයදුම්පත් අධ්‍යාපනික/ වෘත්තීය සුදුසුකම් සහතිකවල පිටපත් සහ සේවා පළපුරුද්ද පිළිබඳ විස්තර සමඟ එවිය යුතුය.
5. සියලුම අයදුම්පත් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත් සහිතව **2025.10.02 දින හෝ එදිනට පෙර "අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08"** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු අතර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ **අධ්‍යක්ෂ / පාලන සහ ආයතනික කටයුතු තනතුර සඳහා අයදුම්පත** යනුවෙන් සඳහන් කළ යුතුය.
6. රජයේ ආයතනවල සේවය කරන අයදුම්කරුවන් සිය අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.
7. අයදුම්පත් **2025.10.02 දින හෝ එදිනට** පෙර ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුය.

**(7) පොදු කොන්දේසි**

1. සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සහ තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
2. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් සලකා බලනු නොලැබේ.
3. ඕනෑම ආකාරයකින් බලපෑම් කිරීම නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ
4. බඳවා ගන්නා තනතුරු සංඛ්‍යාව , බඳවා ගැනීම කල්දැමීම/ අවලංගු කිරීම පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) සතුවේ.
5. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) නියාමන අධිකාරියක් වන අතර , කොමිෂන් සභාවේ සේවයට බඳවා ගන්නා ඕනෑම තැනැත්තකු විසින් ඔහුගේ / ඇයගේ කලත්‍රයා හෝ පවුලේ සාමාජිකයකු කොමිෂන් සභාවේ නියාමන පාලනයට යටත් වන ආයතනයක තනතුරකට පත් කිරීම හෝ රැකියාවක නිරත වීම උදෙසා සෘජුව හෝ වක්‍රව අනුබල දීම / දිරි ගැන්වීම / උපදෙස් දීම සිදු නොකළ යුතුය.
6. සම්මුඛ පරීක්ෂණ ලකුණු දීමේ ක්‍රමය පරිශීලනය සඳහා මේ සමඟ අමුණා ඇත.

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
අංක 276
ඇල්විටිගල මාවත
කොළඹ 08